**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 18 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කම්පන රෝලයේ සහ ජල බවුසරයේ වටිනාකම සහ ලැබිය යුතු රු.12,274 ක පොලී ආදායම ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.22,965 ක විනෝද බදු ආදායම ණයහිමියන් යටතේ ගිණුම් ගතකර තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,237,230 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.3,679,969 ක් වූ අසමානතා විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.9,007,995 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 12 ක වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,348,993 ක් ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.295,642 ක මුද්දර ගාස්තු ද, නිරවුල් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.108,507,307 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, මෝටර් රථ හා කරත්ත,ලී බඩු හා සවි කිරීම් සහ කාර්යාල උපකරණ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ද, එකතුව රු.7,428,862 ක් වූ දේශීය ණය හා සංවර්ධන අරමුදල් ශේෂය සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ණය ලේඛනය හා කාල විශ්ලේෂණය යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති, සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 371(2)(ආ) | අවස්ථා 05 කදී රු.20,000 ඉක්ම වූ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.278,751 ක තැන්පතු ශේෂ වර්ග 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සමාලෝචිත වර්ෂයේදී සභාවට අයත් වාහන 17 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,773,831 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.7,831,630 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,057,799 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 14 ක ප්‍රතිශතයකින් වැඩි වී තිබූ අතර, පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 93 ක තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී වැඩසටහන් තුනක ආදායම ඉක්ම වූ වියදම් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ප්‍රාග්ධන ආදායම රු.10,255,677 ක් වුවද, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.6,612,795 ක් වූයෙන් රු.3,642,882 ක ප්‍රාග්ධන වියදම ඉක්ම වූ ප්‍රාග්ධන ආදායම් විය. සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන ආදායම රු.11,510,000 ක් හා ප්‍රාග්ධන වියදම රු.12,650,000 ක් ලෙස ඇස්තමේන්තු ගතකර තිබූ නමුත්, ප්‍රාග්ධන ආදායම ඉක්මවන රු.1,140,000 ක ප්‍රාග්ධන වියදම සම්බන්ධයෙන් අරමුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳ පැහැදිලි කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් සාරාංශය පහත දැක් වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදන ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 40,521,826 | 25,128,776 | 15,393,050 | 37,747,995 | 22,354,945 |
| 2014 | 37,513,140 | 22,229,120 | 15,284,020 | 29,681,510 | 14,397,490 |
| 2013 | 23,065,696 | 11,367,317 | 11,698,379 | 22,387,772 | 10,689,393 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණු අතර, සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම් වල ඉහළ වැඩිවීමක් පැවතුණි.

(ii) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම්වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

(iii) ආදායම් ඉහල නංවා ගැනීමට අවධානය යොමු විය යුතු බවත්, ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය කළමනාකරණයේ පවතින දුර්වල තත්ත්වය හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වියහැකි බවත් විගණනයේ අදහසයි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

-----------------------------------

ඉකුත් වර්ෂවල තත්ත්වයන් සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේ දී ජංගම හා ක්ෂණික අනුපාතවල තත්ත්වය සතුටුදායක මට්ටමක නොපැවතිණි.

**2.4 ආදායම් පරිපාලනය**

---------------------

**2.4.1 අක්කර බදු**

------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබුණු රු.215,444 ක් වූ අක්කර බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ අය කරගෙන තිබුණේ සියයට 15 ක් තරම් අවම අගයකි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4.2 වරිපනම් බදු**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.4.3 බදුකුලී**

--------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වලට අදාළව අයකර ගතයුතුව තිබූ රු.178,150 ක ව්‍යාපාර බදු සහ රු.49,000 ක් වූ කර්මාන්ත බදු අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(අ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි.

**2.4.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.7,894,290 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.261,750 ක් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවක ණය ශේෂය රු.1,136,592 ක් විය. ස්ථාන මාරු වී ගිය සේවකයන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.41,289 ක ණය ශේෂ ඇතුළත් වී තිබුණු නමුත්, එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරක් ද, පෙර පාසල් පාලිකා තනතුරු 09 ක් ද, සංවර්ධන නිලධාරී තනතුරක් ද අතිරික්තව බඳවාගෙන තිබුණු අතර, පුස්තකාලයාධිපති තනතුරක හා ප්‍රාථමික කාණ්ඩයේ තනතුරු 04 ක පුරප්පාඩු පැවති නමුත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලයේ පිරිවැය රු.63,151 ක් වූ පොත් 664 ක් නැතිවීම සම්බන්ධයෙන් වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉදිරියට ගෙන එන එකතුව රු.295,642 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු නොකර, සභාවේ පොදු අරමුදලෙහි රඳවාගෙන තිබුණි.

**3.2** **විදුලිජනක යන්ත්‍රයක් මිලදී ගැනීම**

--------------------------------------

සභාව විසින් 2014 දෙසැම්බර් 31 දින රු.999,990 ක ගෙවීම් කර පුද්ගලික සමාගමකින් විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) විදුලි ජනන යන්ත්‍රය මිලදී ගැනීම සඳහා වූ පුවත්පත් දැන්වීමෙහි 10 kv – 25 kv අතර ධාරිතාවයෙන් යුතු ජපානයේ නිෂ්පාදිත නව යන්ත්‍රයක් අවශ්‍ය බව දක්වා තිබුණ ද, සභාව විසින් මිලදී ගෙන තිබුණේ 8 kv - 10 kv අතර ප්‍රමාණයේ එංගලන්තයේ නිෂ්පාදිත යන්ත්‍රයකි.

(ii) මිලදී ගැනීම සිදු කිරීමේ දී තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශයක් ලබාගෙන නොතිබු අතර, විදුලි ජනන යන්ත්‍රය යෙදවීමට අපේක්ෂිත ආදාහනාගාරය සඳහා අවශ්‍ය වන යන්ත්‍රයේ පිරිවිතරයන් විදුලි ඉංජිනේරුවරයකු මඟින් ලබාගෙන නොතිබුණි.

(iii) යන්ත්‍රයේ ධාරිතාවය, නිෂ්පාදිත රට, යන්ත්‍ර මාදිලිය, වටිනාකම ආදිය සැලකිල්ලට නොගෙන අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය නොසලකා හැර මිලදී ගැනීම් කිරීම නිසා සභාවට රු.304,990 ක පාඩුවක් සිදු වී තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

(අ) සභාවේ එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ අයවැගත ප්‍රතිපාදන එකී අරමුණු සඳහා යෙදවීමේ දී පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කෙරෙන අතර, එය සභාවට මෙන්ම සභා බලප්‍රදේශයේ ජනතාවට සිදු වූ පාඩුවක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.10,673,324 ක් වූ ඉතිරිවීම්ද, තවත් වියදම් විෂයයන් 02 ක සීමාව ඉක්ම වූ එකතුව රු.7,187,614 ක වියදම්ද, ආදායම් විෂයයන් 06 ක ලඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.3,952,615 ක්ද පැවතීම, ස්වයං උත්පාදන ආදායමින් සියයට 30 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් නොකිරීමත් නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් හා 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/ 01/න.ව.ලේ දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. එහෙත් සභාව විසින් අභ්‍යන්තර විගණනය සඳහා පත්කර තිබුණු සංවර්ධන නිලධාරිණියට සමාලෝචිත වර්ෂයේ දී රු.392,624 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

රෝද හතරේ මිනි ට්‍රැක්ටරය සම්බන්ධයෙන් 2015 ජූලි මස 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ)** **පවරා නොගත් වත්කම්**

**--------------------------**

සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 05 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය